

# චූටි කතාවක් කියවමු

උමේෂි අයන්සා වනිගසේකර
කණිෂ්ඨ බාලිකා විදුහල - නාවලපිටිය

කෘතියේ නම

# චූටි කතාවක් කියවමු

කතෘගේ නම

උමේෂි අයන්සා වනිගසේකර

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශශිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය' මහනුවර - 2023 10 20

# උපන්දින තෑග්ග

එදා බදාදා දවසකි. අපි වෙනදා වගේම උදෑසනින්ම පාසල වෙත අවේ ඉතා සතුටිනි. අපි පන්ති කාමරයට ඇතුල්වන විට ම

“මේ ඔයාලා දන්නවාද අද සුමනා ආච්චිගේ උපන්දිනේලු” සඳුනි දුවගෙන ඇවිත් කිව්වා.

“අනේ ඇත්තද කවුද ඔයාට කිවුවේ?” මම ඇහුවා.

“ගේට්ටුව ළඟදී නැන්දා කෙනෙක් කියනවා මට ඇහුණා” සදුනි කිව්වා.

“අපි මොකද කරන්නේ අපි ආච්චිව සර්ප්‍රයිස් කරමුද?” විනෝදි ඇහුවා.

“අන්න ඒකනම් හොද අදහසක්. ආච්චි හරිම හොඳ කෙනෙක්නේ අපි එහෙම කරමු ” මම කිවුවා.

අනිත් හැමෝමත් ඒ යෝජනාවට කැමති වුණා.

සුමනා ආච්චි තමයි අපේ පාසලේ පිරිසිදු කිරීමේ වැඩ කටයුතු වලට සහායට ඉන්නේ එයා හරිම හොද කරුණාවන්ත කෙනෙක් අපි හැමෝටම හරිම ආදරෙයි. අපේ ආරක්ෂාව ගැනත් හැමවෙලේම හොයලා බලනවා.

අපි හැමෝම එකතුවෙලා උපන්දින සාදය සුදානම් කරන විදිය කතා වුනා.

"අපි කැන්ටින් එකෙන් මොනවා හරි ගේමුද?" නදුනි ඇහුවා.

"අපිට කේක් එකක් නැනේ කපන්න " මියුරි දුකින් කිව්වා.

"ඒක ඇත්ත අනේ අපි මොකද කරන්නේ?"

"ඉන්නකෝ මට හොද අදහසක් ආවා අපි කැන්ටින් එකෙන් මොනවා හරි ගෙනත් ලස්සන කේක් එකක් හදමු" සදුනි කිවුවා.

ඒක හොද අදහසක් නිසා හැමෝම කැමති වුණා. අපි ළඟ තිබුනු සල්ලි එකතු කරලා කැන්ටින් එකෙන් ස්පන්චි, ටොපි, සිනි බෝල වගේ දේවල් ටිකක් ගත්තා ඉටිපන්දමුකුත් ගත්තා.

සඳුනියි මියුරියි තව කීපදෙනෙකුයි එකතු වෙලා ලස්සන ස්පන්ච් කේක් එකක් හැදුවා. තව කට්ටියක් එකතු වෙලා වටපිටෙන් හොයා ගත්ත මල් කොළ අතු වලින් ලස්සන සැරසිලි කලා.

ඊටපස්සේ අපි ආච්චිව එක්කගෙන එන හැටි කතා වුණා. "මමයි විනෝදියි ගිහින් ආච්චිව එක්කන් එන්නම් " සිහේලි කිව්වා.

"ඔයාලා කොහොමද එක්කන් එන්නේ? " මහීමා ඇහුවා.

"ආච්චිගේ ඇස් දෙක වහගෙන" විනෝදි කිව්වා.

"ඔයාලා එයාගේ ඇස්දෙක රෙදිපටියකින් වහගෙන එක්කගෙන එන්න මම රෙදි පටියක් දෙන්නම්" කැන්ටිමේ නැන්දා කිව්වා.

"ඒක හොද අදහසක් ස්තූතියි නැන්දේ " මම කිව්වා.

ටික වේලාවකින් විනෝදි සහ සිහේලි ආච්චිව එක්කන් ආවා. කේක් එක ළගට ඇවිත් ආච්චිගේ ඇස් බැඳලා තිබුණ රෙදි පටිය ගැලෙව්වා. එතකොටම අපි ""සුබ උපන්දිනයක් සුමනා ආච්චි" කියලා කෑ ගැහුවා. අපිව දැකලා ආච්චිගේ

ඇස්වල කඳුලු පිරුණා. ආච්චි අපිව බදාගෙන ඇඬුවා. අපිටත් දුක හිතුණා.

ඊටපස්සේ ඉටිපන්දම් පත්තු කරලා අපි හදපු ස්පන්ච් කේක් එක ආච්චිට කපන්න දුන්නා. අපි හැපි බර්ත්ඩේ සිංදුව තාලයට ගායනා කළා. අපි හැමෝම ආච්චිට වැඳලා සුබ පැතුවා. ආච්චිව සතුටු කරන්න අවස්ථාවක් ලැබුන එක ගැන අපි හැමෝටම දැනුනේ විශාල සතුටකි.

# වලස් පැංචයි වලස් පැංචියි

එක පුංචි දූපතක වලස් පවුලක් ජීවත් වුණා. ඒ පවුලේ වලස් අම්මයි තාත්තායි වලස් පැංචියි වලස් පැංචයි තමයි හිටියේ. චුටි වලස් පැංචි හරිම හොඳ කරුණාවන්ත කෙනෙක්. ඒත් වලස් පැංචා නම් එහෙම නෑ.

ඔන්න එක දවසක් මේ දෙන්නා සෙල්ලම් කරන්න හිතාගෙන කැලේට ගියා. මේ දෙන්නා කැලේ පැත්තට ඇවිදගෙන යනකොට ඇල පාරක් දැක්කා ඒකේ වතුර පාර හරිම සැරයි. මෙයාලා ටිකක් ළගට කරලා බැලුවා.

"පැංචෝ අර බලන්නකෝ.. අතන ඉබි සීයා කෙනෙක් නේද ඉන්නේ?" වලස් පැංචි කෑගැහුවා.

"ඔව් නේද?" වලස් පැංචා කිවුවා.

"එයාට එතනින් එගොඩ වෙන්න බැරිව ඇති. පව් අපි උදව් කරමුද?" වලස් පැංචි ඇහුවා.

"එයා යයි. අපිට පරක්කු වෙනවා. අපි යමු" පැංචි වලස් පැංචා කිව්වා.

"මම එයාට උදව් කරන්නම්" වලස් පැංචි කිව්වා.

වලස් පැංචි ඉබි සීයාට ඇළෙන් එගොඩ වෙන්න උදව් කළා. පැංචිට ගොඩක් ස්තූතියි කියලා ඉබි සීයා ගියා.

මේ දෙන්නා තව ටිකක් කැලේ ඇතුළට ඇවිදගෙන ගියා. මෙහෙම යනකොට එයාලා යන පාරේ හරහට අත්තක් කඩන් වැටිලා තිබුණා.

අනේ.... අනේ.... ආයි......

කවුදෝ කෙඳිරි ගාන සද්දයක් ඇහිලා දෙන්නා ම අත්ත ළඟට ගියා. දෙන්නා ම වටපිට බැලුවා ඒත් පේන්න කවුරුත් නෑ.

"කවුරුත් නෑ. අපි යමු පැංචි එන්න ඉක්මනට" පැංචා කිව්වා.

පැංචි ටිකක් ළංවෙලා අත්ත දිහා හොඳට බැලුවා.

"අනේ පැංචො ඉක්මනට එන්න" වලස් පැංචි හයියෙන් කෑගැහුවා.

"ඇයි ඇයි මොකද වුණේ?" වලස් පැංචා දුවගෙන ආවා.

“මේ බලන්නකෝ ගිරා පැංචෙක් අත්තට යටවෙලා” පැංචි කිව්වා.

“අපි කොහොමද එයාව බේරගන්නේ මේක ලොකු අත්තක්නේ” වලස් පැංචා කිව්වා.

“අපි කොහොමහරි එයාව බේරගන්න ඕනේ අපි දෙන්නා ම එකතු වෙලා මේ අත්ත අයින් කරමු” පැංචි කිවුවා.

ඊට පස්සේ වලස් පැංචියි වලස් පැංචයි දෙන්නාම ගොඩක් මහන්සිවෙලා අත්ත අයින් කරලා ගිරා පැංචිව බේරා ගත්තා.

“ඔයාට අමාරුවක් නෑ නේද?” වලස් පැංචි, ගිරා පැංචිගෙන් ඇහුවා.

“මට අමාරුවක් නෑ. ඔයාල දෙන්නාට ගොඩක් ස්තූතියි මාව බේරගත්තාට. මම කවදාවත් ඔයාලා දෙන්නාව අමතක කරන්නේ නෑ” ගිරා පැංචි කිව්වා.

“අපි ගිහින් එන්නම් ගිරා පැංචි. එහෙනම් ඔයාට සුභ ගමන්” වලස් පැංචි කිව්වා.

ඔන්න දැන් ආයෙමත් දෙන්නා ගමන පිටත් වුණා මෙහෙම ටික දුරක් යනකොට ඒ දෙන්නා එකපාරම බොරු වළකට වැටුණා.

දෙන්නා හොඳමට බය වෙලා උදව් ඉල්ලා කෑගැහුවා.

මේක දැක්ක ගිරා පැංචි ඉක්මනට ගිහින් මේ ගැන වලස් පැංචිලාගේ අම්මටයි තාත්තාටයි කිව්වා.

ඊට පස්සේ අම්මයි තාත්තායි දුවලා ඇවිත් මෙයාලාව බේරා ගත්තා.

"මගේ පුතේ ඔයාලා කොහොමද මේ වළට වැටුණේ" වලස් අම්මා ඇහුවා.

"අපි කැලේ සෙල්ලම් කරන්න ආවේ" වලස් පැංචි ඔක්කොම කතාව අම්මාට කිව්වා

"බොහොම ස්තුතියි ගිරා පැංචි අපිට උදව් කරාට" වලස් පැංචියි පැංචයි දෙන්නාම කිව්වා.

"අපි අනිත් අයට උදව් කරාම අපි කරදරේ වැටුණම එයාලත් අපිට උදව් වෙනවා. ඒ නිසා ඔයාලත් හැමෝටම පුලුවන් වෙලාවට උදව් කරන්න ඕනේ" වලස් තාත්තා කිව්වා.

# මාෂාගේ උපන්දින තෑග්ග

මුහුදේ එක ගල් ගුහාවක් ඇතුලේ දිය කිඳුරු රජ පවුලක් ජීවත් වුණා. ඉතිං ඒ දිය කිඳුරු රජතුමාට ලස්සන දූ කුමාරිකාවක් හිටියා. එයාගේ නම මාෂා. අම්මයි තාත්තායි මාෂාට හරිම ආදරෙයි.

ඔන්න ඉතිං මාෂාගේ උපන්දිනය දවස ලංවුණා.

"චූටි දුවේ මෙහෙ එන්න" උදෙන්ම රජතුමා මාෂාට කථා කළා.

"අද මගේ දුවගේ උපන්දිනය නේ.. මොනවද මගේ දුවට මේ පාර උපන්දිනයට ඕනේ" රජතුමා ඇහුවා.

"තාත්තේ මේ පාර මගේ උපන් දිනයට මට ඕනේ තනියම මුහුදේ ඇවිදින්න යන්න" මාෂා කිවුවා.

ඒක අහලා රජතුමා හොඳටම බය වුණා.

"අනේ මගේ දුවේ ඒකනම් කොහොමවත් කරන්න දෙන්න බෑ. ඒක හරිම භයානකයි" රජතුමා කිවුවා.

“අනේ තාත්තේ මට යන්න ඕනේ මට ආසයි යන්න. මට යන්න දෙන්නකෝ ” කියලා මාෂා අඬන්න පටන් ගත්තා. රජතුමාට හොදටම දුක හිතුණා. මාෂා අඬනවා දැකලා පස්සෙ රජතුමා හිතුවා මගේ දුවව දුකින් තියන්න හොඳ නෑ එයා ඉල්ලන තෑග්ග දෙන්න ඕනේ කියලා.

“හරි මගේ දුව එහෙනම් ඔයා ගිහින් එන්නකෝ හැබැයි පරිස්සමින් කල්පනාවෙන් යන්න ඕනේ හොඳද” රජතුමා කිව්වා.

මාෂා හරිම සතුටින් යන්න සූදානම් වුණා. මාෂා මුහුදේ පීනගෙන පීනගෙන ගිහින් ගල් තලාවක් උඩට නැග ගත්තා. වට පිට හරිම ලස්සනයි. අහස ලස්සනට පේනවා මුහුදේ නැව් යනවා ඩොල්පින් යාලුවෝ පිනුම් ගහනවා. මාෂා හරිම ආසාවෙන් බලාගෙන හිටියා.

ඔන්න එතකොටම එතනින් යන්න ආපු නපුරු මායාකාරියක් ගල උඩ තනියම ඉන්න මාෂා ව දැක්කා. මායාකාරි ගලකට මුවා වෙලා ටික වේලාවක් බලාගෙන හිටියා. මේ චුටි දිය කිඳුරිය මොකද කරන්නේ කියලා.

මායාකාරි හිතුවා. මේ දිය කිඳුරිය එයාගේ ගුහාවේ තියා ගත්තා නම් ගෙදර වැඩ සේරම කරවා ගන්න තිබුණා කියලා.

ඉතිං මේ මායාකාරිය හොඳ දිය කිඳුරියක් වගේ වෙස් වලාගෙන මාෂා ළඟට ආවා.

"ඔයා මොකද මේ ගල උඩ කරන්නේ? මේක මගේ ගල කියලා දන්නේ නැද්ද?" මායාකාරි ඇහුවා.

"මම මුහුදේ ලස්සන බලන්න ආවා. අනේ සමාවෙන්න මම දන්නේ නෑ මේ ඔයාගේ ගල කියලා" මාෂා බය වෙලා කිව්වා.

"ඒකට කමක් නෑ දැන්. ඔයා තනියම මෙතන මොකද කරන්නේ" මායාකාරි ඇහුවා.

"මම අද මුහුදේ ලස්සන බලන්න ආවා" මාෂා කිව්වා.

"එහෙනම් එන්නකෝ මගෙත් එක්ක මම තව ලස්සනම ලස්සන තැන් ටිකක් ඔයාට පෙන්වන්නම්" මායාකාරි කිව්වා.

මාෂා මායාකාරියට රැවටිලා එයත් එකක් පීනගෙන ඈතට ගියා. මායාකාරිය ටික දුරක් ගිහින් ඈත පේන ලස්සන ගල් ගුහාවක් මාෂාට පෙන්නුවා.

“අර බලන්න අර ඈතින් පේන ගල් ගුහාව දැක්කද? ඒක ඇතුලේ හරිම ලස්සනයි. බලන්න දේවල් ගොඩක් තියෙනවා. අපි යමුද බලන්න මායාකාරිය ඇහුවා.

මාෂාටත් ආස හිතුණා ඒක බලන්න.

“අනේ අපි යමු ඒක බලන්න” මාෂා කිව්වා.

දෙන්නම ගුහාව ඇතුළට ගියා. මායාකාරිය කිවුව විදිහට ගුහාව ඇතුළ ලස්සන නෑ හරිම කරුවලයි. බලන්න කිසිම දෙයක් නෑ මාෂා හොදමට බය වුණා.

“මේ කොහෙද මේ අනේ මට බයයි අපි ආපහු යමු” මාෂා කිව්වා.

“හහ්.. හහ්.. හා.... මේ තමයි මගේ මායා ගුහාව මම මායාකාරියක්” මායාකාරිය එහෙම කියලා එයාගේ වෙස් මාරු කරගත්තා.

නපුරු මායාකාරියව දැකපු මාෂා හොදටම බය වෙලා අඩන්න පටන් ගත්තා. “අනේ මට යන්න දෙන්න කියලා.

"කොහේ යන්න ද? අද ඉඳන් ඔයා මගේ හිරකාරියක්. මේක තමයි ඔයාගේ හිර කූඩුව" කියලා මාෂාව කූඩුවක් ඇතුලට දාලා හිර කළා.

මාෂා හයියෙන් ඇඬුවා එයාට යන්න දෙන්න කියලා.

"කෑගහන්නේ නැතුව ඉන්න මම එළියට ගිහින් එනකම්" එහෙම කියලා මායාකාරි ගුහාවෙන් එළියට ගියා.

මාෂා මොකද කරන්නේ බලන්න ගෙදර ඉඳන් ම මාෂාට හොරෙන් මාෂාගේ පස්සෙන් රජතුමා ආවා. රජතුමා මේ හැමදේම බලාගෙන හිටියේ. මායාකාරි ගුහාවෙන් එළියට ගිය ගමන් රජතුමා ඉක්මනින් ගිහින් මාෂාව කූඩුවෙන් බේරගත්තා.

දෙන්නම ඉක්මනින් එයාලගේ ගල්ගුහාවට ගියා.

"මගේ දුවට තේරුණා ද මම තනියම යන්න එපා කිව්වේ ඇයි කියලා" තාත්තා ඇහුවා.

"ඔව් තාත්තේ, ආයේ කවදාවත් තනියම කොහේවත් යන්නේ නෑ" කියලා මාෂා අඩ අඬා තාත්තාට පොරොන්දු වුණා.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20